# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/44 - 2020 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වන වගන්තිය යටතේ නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ තලාබංඩාරලාගේ ජයතිලක අයත් වන්නා වූ අංක 01 ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩයාමට අයත් වන්නාවූ ද, එම නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා හේවා දේවගේ අරුණසිරි ඉන්ද්‍රවංශ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් හේවා දේවගේ අරුණසිරි ඉන්ද්‍රවංශ, නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම්භාර නිලධාරී,
නාමල්ඔය ප්‍රාදේශීය සභාව.

2020 පෙබරවාරි මස 12 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

02 - 593

1A - G 32020 — 27 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*